


ඔක්තෝබර් අහස
අමු ම අමු සොහොන් පිටියක්
එක ම එක සුදු කොඩියක්
වේදනාවෙන් ලඹ දෙන
ඔබ කැමති නම් එයට
සඳ කියා අමතන්න

මිත්‍රයෙක් ඉන්නවා අපට
දත් වලින් හිනාවෙන
ඇස් වලින් කතා වෙන
ඔක්තෝබරේ දවසක පණ ඇවිත්
ආයෙමත් මියැදෙන

උණ්ඩයකටත් තියෙනවා
නිමේශයක ජීවිතයක්
මිත්‍රයෙක් වෙනුවෙන් තියෙන්නේ
ඔක්තෝබරෙන් දිනක් විතර ද

කඳුළකට පවා තියෙනවා
උණුහුම හෝ සිසිල වෙනුවෙන් වාසගම්
මව්බිමක් නැති මිත්‍රයෙකුට තියෙන්නේ
වාසගමකුදු නැති මරණයක් විතරද

ඒ මිතුරාට තමයි
ඔක්තෝබරේ පණ එන්නේ
ඒ මිතුරාම තමයි
ආයෙ ආයෙම මියැදෙන්නේ

**මංජුල වෙඩිවර්ධන**
(නිමලරාජන් ඝාතනය කොට ඔක්තෝබර් 19 දා ට අවුරුදු 09 කි)

## අඩු ලංසු කවිය

සුහද.
කවිය මා ලියු
වී නම් ලලනාවියක්
නොමැත අෑ සතු රූ සපුවක්
උපතින් ගෙනා.

එබැවින් සබඳ,
නොතලනුය ඔබ හද
අෑ තුනු විල
කිම්දෙනු රිසියෙන්.

මා මනස කැඩපත අබියස හිඳ
අෑ
සති ගණන්,
දින ගණන්
කල් මරා,
නිදි වරා,
වෙර දරා,
එළිවැට වත්සුණෙන්
ඔපලා උවන,
වදන් මල්කමින්
විරිත් ලියකමින්
සමලංකෘත

රන් ආලේපිත
තඹක්ක අබරණ
පැළඳ සියොළඟ,
මවා පෑ පුහු ආටෝපයටද
මුළා වූයේ ඔබ ?

**මොරගොඩ මලියසේන**

## දික්සඟළාව

නිවහන් තනවමින දවසම නව තාලේ
ඇවිදින් ගෙදර හිරුගල වැටෙනා වේලේ
දික්සඟළාව පියරජු හොබවන කාලේ
වැජඹුණි සිහසුනක ලෙද එය ගෙයි සාලේ

අම්මා බුදු පාන දල්වා ගෙට එන්නේ
පියරජු අසුනරා තෙදැතිව වැඩ ඉන්නේ
අපි හැම දෙනා තුරුලට බිම ඉඳ ගන්නේ
එවිටයි රජ සබය සාලයෙ ඇර ඹෙන්නේ

අකුරට නොගිය වරදට දඬුවම් ලැබුණ
සණ්ඩු සරුවලට තද ඔවදන් කෙරුණ
රාජාසනේ අණ වැසියෝ පිළි පදින
යුගයක සංකේතයකි මෙඅසුන පරණ

නව යුගයකට ගේදොර සරිලන විලසේ
ගෙනැවිත් තැබූ පබලියමකි දැන් නිවසේ
දික්සඟළාව දර මඩුවට වැඩි දවසේ
අම්මා කඳුළු පිස දැමුවේ හොර රහසේ

**පද්මසිරි හේරත්**
වෙරිබි, වික්ටෝරියා

## ලහි ලහියේ පිහිට වන්න

ඇය දුටු සඳ
සිත සතුටින
පෑ මදහස
බොඳ වී ගිය

දෑත් දිගැර
පා සෙනෙහස
වැළඳ ගැනුම
බැරි වුණ සඳ

බස දොඩනට
මුව කමලට
අපහසු කල
සිත බිය වැද

පිහිට පතා
වෙද මැදුරට
පමා නොවී
ගෙන යනු සොඳ

**ලක්ෂ්මී ගුණරත්න**

## සිවරමණී......

*නිලර් එන්. කාසිම් විසින් පරිවර්තනය කරන ලද සහෝදර පියාපත් කෘතිය තුළ අන්තර්ගත සිවරමණි කිවිඳිය විසින් රචිත කවි කියවීමෙන් පසු ලියන ලද ගීතයකි. සිවරමණි කවිය ,චිත්‍ර ශිල්පය, නර්තනය, ඡායාරූපකරණය වැනි ක්ෂේත්‍ර ගණනාවක සුවිශේෂ කුසලතා පළ කළ තැනැත්තියකි.අවුරුදු 21 පමණක් ජීවත් වූ ඇය 1991 මැයි 19 වන දින සිය දිවි හානිකර ගත්තාය.*

සිවරමණී කවුද ඉතිං අපේ දුකට අඬන්නේ
කඩදාසි ඔරු වලින් කොහොමද තමිල්නාඩු දුවන්නේ
තල මල පිපිලා මොකටද තල් වැට නැහැ බිඳෙන්නේ
ඇහැට ඇඟිල්ලෙන් ඇනගෙන තනියෙන් අපි අඬන්නේ

ටොකු ඇන ඇන කියා දෙන්න
ගුරුවරු නම් ඇති
හිත රිදුනම නාරා
හිත හදා ගන්න හැටි
යාපනයේ පෙළ පොත් වල
ඒ පාඩම නැති
ඇත්ත තමයි සිවරමණී
මරණය යහපති

පිච්ච මල් නෙලා
කෝවිල් ගිය අය බෝ වෙති
හදිස්සියට වත් දෙවොලේ
දෙවියෙක් නැති හැටි
ජීවිතයක් මොකටද හෙට
හිනා වෙන්න බැරි
ඇත්ත තමයි සිවරමණී
මරණය යහපති...

**ප්‍රසාද් වීරසේකර**




සුළැඟිල්ලෙන් අල්ලා ඔබ
අකුරට මා ගෙන යන කල
සිතුණේ නැතුව ඇති
ඔබ අසරණ වී
සුළැඟිල්ලක් සොයනා කල
ඔබ ළඟ මා
නැති වේවි කියා අම්මේ.. !

සක්වල එතෙර ට යන්නට
මා හට තතු කියා දී
මා දිරිමත් කල ඔබ
සිතුවේ නැතුව ඇති
ඔබ අසරණ වූ කල
ඔබ ළඟ මා
නැති වේවි කියා අම්මේ.. !!

ඔබට අහිමි ඒ සුර ලොව
මා හට සුව විඳින්නට
ඔබ ගැනවත් නොසිතා ඔබ
පිටමං කළා නොවේද
මා නොරටට අම්මේ..!!

සිතුණේ නම් මෙවන් දිනක්
උදා වේවි කියා අපට
කළත් ඔබ කොතරම් පෙරැත්ත
නැත කිසිදා එන්නේ මම
ඔබ දමා නොරටට
මගෙ රත්තරං අම්මේ..!!

**සංජික සමරනායක**

***අන්තර්ජාලයේ සාහිත්‍ය කවුළුව***

## ඉතිහාස පාඩම

ජාතික ඇඳුම
ජැන්ඩියට ඇන්ද
රණසිංහ සර්
උස්සං සරම කොණකින් - පපුව දික් කරමින්
ඩෙස් බංකු වල හැපෙමින් - වේවැල් අසිපත වනමින්
ඉගැන්වූ
ඉතිහාස පාඩම
මට මතකය
මයිල් කෙළින් වී
පුටුවෙන් ද පස්ස ඉස්සුණු
ඉතිහාස පාඩම
මට මතකය

කපා කොටා පිළිමලුන් - ලේ බේරෙන අසිපතින්
නොසලකා දරුවන් මහල්ලන් - වනසා ගම් පිටින්
අල්ලං ඇවිත්, ඇතුන් ලවා පාගවා ද්‍රෝහීන්
දික් විජය කර ඇත දෙරණ ම
බලකොටු බැඳ
ගම්වල උස් තැන් වල

වැසියෝ ප්‍රීතියෙන් ඉපිලේ
මහන්තත්ව ය අඬබෙර ගහන
නගර වල තැන් තැන් වල
සංදර්ශනය ජය පැන් බොන, නොනවතින

රජු නිදොස්ය
කේවට්ටයෝ පෙරට එති රකින්න ට
වැරැද්දක් කළොත් ගෝලයෝ ය බාලයෝ ය
වැසියෝ වීදි වල රැස් වී ඇත
උද්ඝෝෂණය ට
එරෙහිව
දිනෙන් දින වැඩිවෙන
රජුගේ කීර්තිය නසන්නන් ට

බන්දවා වෙහෙර, රටේ අට කොණ
පූජා කොට ඇත් පැටව් දේවාලෙ ට
වාත්තු කොට රන් රිදී - ඔබ්බවා මිණි දියමන්ති
නිමවා ඔටුන්නක් අසිපතක්
රට දිනූ මහරජු ට

රණසිංහ සර් දැං නැත - ඉතිහාසයට ගොස් ඇත
ඔක්කොම දේවල් දන්න
රණසිංහ සර් වත් දන්නැති
අත්දැකීමක් මට දැං ඇත.
මට මතකය

**මහේෂ් මුණසිංහ**

# පහන් වැට

සංස්කරණය තුෂාරි ප්‍රියංගිකා

## අහස නුඹ හරි කුරිරුය

අහස නුඹ වී පොළොව මම වී
මේ මනරම් ලොව තැනුවාට
අහස නුඹට ඉර හඳ තරු ඇතුවාට
පොළොව මගේ ගංගා දිය ඇලි
හෙල් කඳු ඇතුවාට

අහස නුඹ දෙන මහා වැසි
දරා ගත නොහැක මට
මගේ සරු බව සොබා සිරිකත
දිය වී යයි මහ මුහුදට
අහස නුඹ වී පොළොව මම වී
මේ මනරම් ලොව තැනුවාට

අහස නුඹ දෙන මහා නියඟ
දරා ගත නොහැක මට
දවා හළු කරලයි
මා සියල්ල
අහස නුඹ වී පොළොව මම වී
මේ මනරම් ලොව තැනුවාට

අහස නුඹ දෙන හෙන අකුණු පහර
දරා ගත නොහැක මට
සැනින් ගිනි ගයි
මගේ ගත සිත
අහස නුඹ හරි කුරිරුය

**සුජීවා ඉල්ලංග**

## අයා ඇති නෙතු

නෙතග ඇවිලී දුහුල සළු දිලි
සේය මුතුකැන් කඳුලූ පොදි පොදි
කිසට නැති කැඳ පොදක් බෙදි බෙදි
අරුණු යාමය පෝලිමක වෙති

දිනෙක උපනට දැයෙක නිමි නැති
අවර ගිරගට ඇදුනු වැට බිඳි
කුකුස් සිතැති සතර සෙන්පති
දනට පිළිවෙසි බෙදෙන බත් කැටි

ඇගට වස්තර නෙතට නිදි නැති
ඉහට ගිනි අවු සෙවණ දිස් නැති
කුවෙර අත මුනි දැවටු බණ පොදි
රැගෙන එන ජීවිතය ඍණපති
පිනෙන් සිස් වූ සඳෙත් කැන් නැති
මලානික රැස් කාන්ති විහිදති
අවතැන්ව කැණිමඩල මිහිපති
අනාතයෝය; අපි කෙලිද්දි අවල රති

නොවෙ කිරිබත් දනට මග පස
නොවෙ මධුවිත ඇන ඇන බොන්නට
නොවෙ සරණක් හිරු කෙලි හිස මත
නොවෙ වදනක්
කෝ කොහි සුමිතු උන් වට

චූලෝදර මහෝදර මහ සටන් වැදි
අතර වැසි හුන් ශ්‍රමික ගොවි දරු
අතරමං ව නිති ඇඳිවත හිමි ඇති
අයා ඇති නෙතු ගණන් නොකලැකි

සාගින්දර තුවාලෙන් මියැදෙන
උන්ටත් ඇසෙන්නට පත්තු කළ මැන
තුන් හුලසක් හංදියේ උස් බැම්ම මත
උනට සිත පිරී; යන්නට සදෙව්ලොව

**ඩෝසන් ප්‍රීති**